ළමා කවි

අතිපූජ්‍ය පැළැණේ සිරි වජිරඤාණ නාහිමිපාණන් විසින් රචිත ළමා කවි එකතුවකි.

අර පරෙස්සම හා
පිරිසිදුකමත් සිහියත්
කඩිසර කමත් ණුවණත්
නිතරම දියුණු කරණේ

මුතුන් මිත්තන් හට
මව් පිය ගුරුවරුන් හට
වැඩිහිටි සහෝදරයන්
හටත් කීකරු වන්නේ

හැම ළමයෙක් ම මතු
ලොකු මහතෙක් වෙමියි යන
අදහසින් හැම කටයුතු
සැලැකිල්ලෙන් කරන්නේ

බොරුවක් කේළමක්
අනුන් සිත් රිදුවන්නක්
සබයට නුසුදුසු බසක්
කෙසේවත් නොකියන්නේ

බණ ඇසුමට ඉතා කැමැති
පණ මෙන් සිල් රැකි සැදැහැති
අණ ලෙස හැසිරෙන දඟනැති
ගුණවත් දරුවෝ යහපති

තමන් බාහු බලයෙන් සපයා ගත්තු
දෙයින් සතුටු වන දනමයි පොහොසත්තු
අනුන් දනය නිකමට හිමි කර ගත්තු
දනත් විනා ලොව කවුරුද පුහු සත්තු

කවා පොවා සරසා සිඹ සනස්වතී
ඔවා දිදී සුසිරිත අප හසුරුවතී

ලවා ගුරුන් සිප් සතර ද   උගන්වතී
දිවා රෑහි මව්වරු වැඩ   සලස්වතී

මව් පියනට පෙම්   කෙරුවෝ
ගුරුවරුනට   කීකරුවෝ
වැඩිමලුනට ගරු   සරුවෝ
වෙති සොඳ සිංහල   දරුවෝ

වෙලාවට ම හැම කටයුතු වලැ   යෙදෙනූ
නොලා කල් පටන් ගත් කටයුතු   නිමනූ
මලා නික දූමුක නොව හුරුබුහුටි   වනූ
බලා මතු දියුණු සිහියෙන් මෙහෙ   කරනූ

සිහි ඇති තැන ඇත   ඉවසිලි
සැනසිලි පියබස්   පැවැසිලි
සන්සුන් තැන්පත්   පැවැතිලි
හැම මොහොතෙ හි   නො පසුතැවිලි

තමන්ගේ වැඩුම් පිරිහුම්   සියල්ලා
තමන් ගුණ දෙසින් වන බව   දතිල්ලා
අනුන් පිට නිකම් දෙස්   නො පවරල්ලා
කටින් ජය ලබන්නට නම්   නොයල්ලා

අනුන් දෙස් කියා පෑමට   නො යන්නේ
තමන් දෙස් සොයා අතහැර   දමන්නේ
ගුණෙන් නුවණින් දින දින   වැඩෙන්නේ
බුදුන් දම් සඟුන් වෙත බැති   වඩන්නේ

පන්සිල් රකින දරුවෝ දෙව්ලොව   යෙතී
පස්පවු කරන මරුවෝ නිරය   පුරවතී
පව්පින් නොදන කැරුවෝ නම්   පසුතැවෙතී
ඉන් සිල් රකිවූ සුරුවෝ නම් ඔහුම   වෙතී

සැමා සුසිරිතෙහි පුහුණුව   ලබන්නට
තමා වැරදි එකිනෙක හැර   දමන්නට
පමා නැතිව සිප් සතරත්   උගන්නට
ළමා වයස නිසි වේ මුල   පුරන්නට

බුදු රුවනට බැති   දැරුවෝ
දමුරුවනට රැති   කරුවෝ
සඟරුවනට ගැති   යූරුවෝ
වෙති සොඳ සිංහල   දරුවෝ

කරතොත් කරපත්   හරියට
බැරිනම් පලයන්   අහකට
අතපත ගාමින්   වටපිට
බලමින් ලතැවෙන්නෙ   කුමට

බණ දැන ගෙන හැර   නිදි ගැට
ගුණ ණුවණින් බැස   සුමගට
නොකඩ වැ තැත් කරන   කලට
කිමද නොහැකි මිනිසුන්   හට

සිහි ඇතිවිට නිත්දෙහි   දිත්
සැලකෙයි වත සියලු   පමත්
සිහි නැති විට ඉණෙ   වතත්
නොදැනෙයි ඇති නැති බව   වත්

මුළු ලොවැ හැම සත්හු
සුව කැමැති වෙති නියතිනි
එබැවින් කුරුකුහුඹුවකුදු
පවා නො පෙළවූ ළමයිනි

උදයෙම නැගිට නොමැලිව පාඩම්   කරන
ඇදැහිලි ඇතිව තිසරණ පන්සිල්   රකින
වැඳ මව්පියන් හට කිකරුව   දවසරින
හොඳ ළදරුවෝ රජ දරුවෝය රට   රකින

කුලුණු මෙත් ඇ හැම
ගුණයෙන් පැමිණ අගතැන්
මුළු ලොවට බොදු දරුවෝ
කලණ මිතුරෝ වෙත්වා

නූගත් නො හික්මුණු
පහත් වල් කොලුවන් හා

පව් කරනුවන් සමගත්
ඇසුරට නම් නොයන්නේ

වැඩි දෙඩුමත් අනුන්
ඕපාදූප ඇසුමක්
හිතෙනුත් නො කරන්නට
තරයේ සිතට ගන්නේ

ඇඳුම් පැළැඳුම්වත්
ලියන කියනා දෙය වත්
නො කෙලෙසන නො ඉරෙන සේ
රැක ගෙනම වැඩ ගන්නේ

කොතැන ද නුවණ යුතු නො පසු බට   වීරිය
එතැනම තමා මුළු දියුණුවට   කාරිය
ඉතා අප සිහල බොදු සෝවුරෙනි   ආරිය
නිතර ම වඩවූ ඉන් නැණ පෙරටු   වීරිය

අයිති නැති දේවල්
අවුස්සන්නට නො ගොසින්
තමන්ගේ කටයුතු ටික
පමණක් බලා ගන්නේ

නො සන්සුන් දළ දඩු
කැරම් කියුමුත් සිතුමුත්
හැර මට සිලිටි පෙවෙතින්
කල් යවනට සිතන්නේ

ලෝ සසුන් දෙකටම
කිසි වෙහෙසක් නො සිදු වන
නො මනා දෙයෙහි නො බැඳී
පිලිවෙතෙහි පිහිටන්නේ

කරන කිස කියන බස සිතන   සිතිවිලි
යනෙන මග පැමිණි තැන සියලු   හැසිරිලි
දකින අය සිතෙහි ඇති වන සෙ   පැහැදිලි
සොඳින පිරි සිදු වැ කල මැනැවි   හැරුමැලි

පැහෙන්න ට පළමු ඉදුණා මෙන් ගෙඩිය
වැඩෙන්න ට පළමු දැනුමැති කම් වැඩිය
දෙඩන්න ට නො ගොස් හැර කට මැත එඩිය
උගන්න ට සිතමු ළමයිනි, වැඩි වැඩිය

බිය නැති මහ පුරිසරුවෝ
ජය ගැනුමට වැර කරුවෝ
පිය පරපුර රන'කුරුවෝ
පිය කරු සිංහල දරුවෝ

ගැටිලි ඇනවිලි ඇඹැරිලි හිස කැසිලි
කැරිලි උගුර පැදිලි වටපිට බැලිලි
නැසිලි නො පෙනිලි ද හිස් පැන් වැඩි දෙඩිලි
පැදිලි කෙරෙති කම්මැළියනගෙ මැතිරිලි

බණ දහමක් නො ද වෙන සතර තොරතුරු
පණ යන තෙක් ඉගෙන ගත්තත් නොයෙක යුරු
ඉණ බඩ දෙක්හි කටයුතු මිස ඉන් ගැඹුරු
නැණ වැඩුමෙක් නොවේ ළමයිනි, කිසි අයුරු

යමෙක් ගුණ දහමින්
නිරතුරු ඔවා දේ නම්
හේ වේ කළණ මිතුරා
අමා සුව සළසා දෙන

කොර ගස ගසා යන අසරුවෙකුට අනුව
පෙ ර අසකුත් ගිය හැටි සළකා ගනුව
නි ර තුරු පෙනෙන වැඩිහිටියන් ගති අනුව
ව ර දට හොදට දරුවෝ හැදෙතැයි දනුව

තම හට පිහිට තමාම කොට විසිය යුතු
වට පිට පිහිට සොයමින් නො ලත විය යුතු
අනුනට නිකම් දෙස් මැසිවිලි නොකිය යුතු
දිනනට දෙලොව තමා මැ වැර වැඩිය යුතු

පළමු ව තමන් දියුණුව මග බලන්නට
දෙවනු ව අනුන් හට හිරිහැර නො දෙන්නට

තෙවනු ව රටුන්ටත් හිතවැඩ කරන්නට
සිතමු ව නිකම් බොරුවට නො දඟලන්නට

බාලේ සිටම දෙඩමළු බව දුරලන්න
කාලේ ටිකක් වත් අපතේ නො යවන්න
ආලේ ඇති ව ඉගෙනීමට වෙහෙසෙන්න
කාලේ සියලු දෙලොව ම වැඩ කරගන්න

ක ට යුතු නියම වේලෙම නො කොට ඒ විගස
ම ට බැ දැන්ම පස්සේ කරමැයි සැනැස
පි ට පිට කල්දමන සැළැකිලි නැති අළස
මොට යත් දියුණුවක් සැළැසෙන්නෙ කෙලෙස

වීරිය දිරි ගුණ දූරුවෝ
කාරිය කරනට සූරුවෝ
සූරිය සරි තෙද ගරුවෝ
ආරිය සිංහල දරුවෝ

නම කැත නො වනසේ
ගරු නම්බුව රැකෙන සේ
මතු දියුණු සැලෙසෙන සේ
බලා ගෙන හැසිරෙන්නේ

නම හ ට පිහිට තෙමෙමැයි යන බණ පදය
සිහිකො ට නැගිට පළමුව හැම දින උදය
දව ස ට අයත් කටයුතු කල් නොවැ රුදය
කරන ට පුහුණු වව් ළමයිනි, විදි ලෙදය

දෙගුරුන් ගුරුන් හෝ
වෙන වැඩිහිටියවුන් හෝ
දෙනෝ’වා පිළිගනිල්ලා
කීකරු වැ සොඳ ළමයිනි

නම එකම පුතු දිවි
පුදා රක්නා මව සේ
හැම සතුන් වෙතැ අපමණ
මෙත් සිත් වඩනු මැනවි

ඇස ට කනට පිය කරුවෝ
ගෙයට දෙරට සිරි සරුවෝ
වත ට ගොතට සඳ හිරුවෝ
රට ට පිහිට සොඳ දරුවෝ

කයිනුත් සුවැත්තෝ
කිසිත් උවදුරු නැත්තෝ
වෙත්වා සියලු සත්හුම
සුවපත් වූ සිතැත්තෝ

මව් පියන් දෙවරක්
කියන තෙක් කවදාවත්
නො හිඳ ඒ කී කිවක්
කී ලෙසට ම කරන්නේ

මඳ පමා දෙසිනුදු
දුදනෝ පළි ගතිත් මැයි
පුදන නො පුදන කහටක්
සුදනෝ වැඩ ම සලසත්

කැර - ලැබැ - ඉගෙනැ ජය ගෙනැ මිස අතරෙකැ දී
හැර කලකිරී පසු බැසැ නො ළතැවේ සුදී
කර දර අතුරු අනතුරු මැයි විඳි පරිදී
වැර වඩනෙමැය සැනසෙන තෙක් කෙළවරදී

නොයෙක් දේ ඉල්ලා
අඬමින් කොඳුර කොඳුරා
මවු පියනට වද නොදී
ඉන්නට පුරුදු වන්නේ

ඇසූවන් සිත් ඇදෙන
පිය මුදු සැබෑ පමණක්
ඉතා අඩුවෙන් කීමට
නිතරම පුරුදු වන්නේ

මර ණ නො බන පුරි සරුවෝ
දෙර ණ බිඳින දිරි දරුවෝ

උර ණ නො වන තව   සරුවෝ
පොරණ සිහළ කුල   දරුවෝ

ආරි ය සිහළ බොදු ළමයිනි,   කිසි දවස
නැරිය යුතුය සිය අදිටන වී   අලස
කාරි ය කෙරෙන තුරු දිරියෙන්   නො පසුබැස
වීරි ය වඩවූ දෙ ලොව ම දියුණුව   පිණිස

නිත ර ඔලුව කසමින් ඇනුම්   අරින
වැති ර ඇඹරි ඇඹරී කෙදිරිත්   ගාන
පැහැ ර හරින කටයුතු නිදිබර   කමින
නොති ර අලස දන දියුණුව කොයි   ලෙසින

තණ පත අග රැඳි පිනිබිඳ ලෙද   උදය
පණ නො තිරය යන සුලුමය   නො වැරුදය
බණ දැන ගෙන දිවියෙහි තතු   පිළිවිදිය
ගුණ දහමට නතු වූවමැනැ හැම   සඳය

දරුවෙනි, ගුණෙ'තුම්
සිය රටට ජාතියටත්
දිවිපුදා මෙහෙ කරන්නට
නිතරම ඉටා ගන්නේ

කර න දෙයක් සකසා සපුරා   කැරුම
වැඩෙ න පිනැතියන් සිරිතෙහි   නිරතුරුම
තත න තතන යම්තම් ගාවා   කැරුම
නිහි න දුබග පිරිහෙන අයටයි   උරුම

ළ මා වයසෙදිත් හොඳ දරුවෝ   පිනැති
ප මා නොවෙති දෙ ලොවමැ වැඩ   කරගනිති
දෙ මා පියන් වැඩිහිටියන් සිත්   ගනිති
මෙ මා සැවොම පැහැදුණු සේ කල්   යවති

අනු න් ගෙන් ම ඉණ බඩ වඩනා   ගතිය
හිඟ න් නන් ගෙ සිරිතක් බව දත   යුතුය
එයි න් මිදුණ හරි පිරිමින් ගේ   ගතිය
ලබ න් ට නම් නොමැලි වැ වැඩ   කලයුතුය

තිරිස න් සතුන් දුක දක උණුවන   හදය
මිනිසු න් දුකෙ හි යකඩට ගලකට   තදය
මෙලෙසි න් ලොවට පෙන්වන කරුණා   හදය
මිනිසු න් නොමැති ලොවක දි වඩනොත් හොඳය

තරයේ වැර වඩවූ
නො නැවත ඉදිරියට යවූ
පසුබට නො වවූ මදකුත්
දියුණුව පතන ළමයිනි,

සිහි නැති තැන ඇත   පැටලිලි
ගෙරවිලි දත් සැපිලි   රැවිලි
සැහැසි වහසි දෙඩිලි   හැඩිලි
තැතනිලි ළතැවිලි   කෙඳිරිලි

ත මා හිසට තම අතම යැ යන   බසද
ළ මා වියෙහි සිටැ සිහිකරමින්   තිබඳ
සැ මා මොහොතැ සිය කටයුතු   දෙ ලොව බඳ
ප මා නොවී සපුරවූ මෙර මා   නොයැද

මහ පඩිකම් නො මැති   අයත්
සිහි විමසුම් ඇති   වුව හොත්
කලබල නොවැ   කොතැන් හිදිත්
සැනැසිලි ලබතැයි   පවසත්

කන්නට දෙඩන්නට
පමණක් කට තියේ යැයි
කට්ටා'වක් නො විමසා
නොම කියයි ණුවණැත්තේ

දරුවෙනි, කිසි කලෙකැ
දුටු දුටු දේට නො හඬවූ
ලද දෙයින් ම සතුටු වැ
දෙගුරුන් සිත් සනසව්

සිය කුල'හසැ දිලි   තරුවෝ
ගිය තැන හොඳ නම්   දරුවෝ

ලිය නට කියනට   සුරුවෝ
පිය වදනැ'ති හොඳ   දරුවෝ

මගේ මෙතෙක් වැරදි හා අඩුකම් තිබෙද් දී
කාගේ කොතෙක් වරදවත් නො සොයම් නො දක්වම්
දෙස්නෙත් මිදෙන්ටත් ගුණෙන් නුවණින් වැඩෙන්ටත්
වැයම් කරම් දිනපතා සිහියෙන් යෙදී මම්

දරුවෙනි, සියලු වැඩ
ඉක්මන් නොවී සිහියෙන්
හා තැනට තිසි නුවණින්
කරන්නට පුරුදු වන්නේ

දන් සිල් පුරන්න ට
තෙරුවන් වැඳ පුදන්නට
බණ ඇසුමට ඉගැන්මට
නිතරම කැමති වන්නේ

සියල්ලම සපුරා -
මිස යන්නමින් ගාවා
බාගෙට නො කරන ලෙසින් -
තරයේ ඉටා ගන්නේ

තිසරණ පන්සිල් හි
පිහිටා පුදව් තෙරුවන්
ඉදින් වැඩියක් හැකිනම්
අට - දස - සිලු දූ සපුරව්!

දහම ට රිසිවන හොඳ   දරුවන්නේ
වැඩුමට දෙවියන් පිහිට   ලැබෙන්නේ
සියර ට දියුණුව ඉන්   සැලැසෙන්නේ
තමන ට දෙ ලොව ම සැප ද   ලැබෙන්නේ

මවු පියන් අවසර
නැතිව තමනට කිසිවකු
කොතරම් දෙයක් දුන්නත්
එය ද නොම පිළි ගන්නේ

කී කරු   දරුවනට මව්පියෝ පෙම්   වඩතී
ඇදුරු   වරුත් ඔවුනට ආදර   කරතී
ඇසුරු   නැසියන් එලෙස මැ කැමැති   වෙතී
කීකරු   දරුවන්ගේ ගුණ කවුරු   නො වනතී

මුතුන් මිත්තන් මවූ
පියන්ගේ හොඳ පරපුර
තමන්ගෙන් ඉහළට මිස
පහළට නොයා දෙන්නේ

තෙරුව න් වැඳැ පුදමින් බණ අසමින් ගුණ   පුරමු
දෙගුරු න් සිත සතසන්නම හැම’තින් වැර   වඩමු
ඇදුර   න් තුටු කරමින් නෙක සිතු’ගන්නට   සිතමු
මෙලෙසි න් ගුණ දහමින් සහ නුවණින් අපි වැඩෙමු

සිප් සතරත් ඉගෙන
සිරිත් විරිතුත් දැන ගෙන
ගුණ දහමිනුත් දියුණු ව
වැඩෙන්නට තැත් කරනේ

දිග දුර බලාගෙන
මතු දියුණුව පතාගෙන
ගුරු දෙගුරුනට කීකරු ව
වැර වෑයම් කරන්නේ

සටනට   ත් දමුණු අසුපිට නැගී   යෙතී
මෙහෙයට ත් හීලෑ වූ ඇතුම ගෙනැ   යෙතී
ගෙදරට   ත් එබඳු මෙහෙකරුවො සරි   ලතී
පවුලට   ත් කී කරු දරුවෝ ම   ගැළැපෙතී

හැමකල් ඇඟලුම් කම් පා අතැ   එල්ලී
සුරත ල් සිනා මුසු පියබස් දෙන   ලොල්ලී
නිසික ල් හි වත් අකුරට නම් නැති   මැල්ලී
සැනසිල්ල නම් පවුලට කීකරු   මල්ලී

දෙගුරු නොඳ වඩන දින දින මන   රංගී
කීකරු   හුරු බුහුටි ගුණ ණවණින්   තුංගී

ළදරු වද පිනට දහමට සිතු නංගී
මහරු සිතුමිණෙකි පවුලට හොඳ නංගී

බා ල සොහොවුරන් දෙස් දූටු විට වයියා
කා ලයට සුදුසු උපදෙස් දෙන දෙයියා
කෝ ල සැර සුමඟ පළමු ව යන ගොයියා
ගෝ ල ගුරුතුමෙකි පවුලට හොඳ අයියා

මලුන් නඳන් සිය ආසිරිය දක්කා
නිතින් යහපතෙහි යොදනා නො වලක්කා
ටිකින් පිරිමසා වැඩ කර ගත හැක්කා
උපන් දෙවැනි මව නම් පවුලට අක්කා

උ ඳ සිරින් මුලු ලොව මෙලෙස පිබිදෙත
නි ඳ හිඳිනු ළමයිනි, අපට නැත
සෙ ඳ පිබිදූ මුව දෙවැ නිසි සෙ හැඳැ වත
වැ ඳ බුදුන් දෙගුරුන් පොත උගත යුත

සියල්ල ම සපුරා
මිස යන්තමින් ගාවා
බාගෙට නො කරන ලෙසින්
තරයේ ඉටා ගන්නේ

මෙයින් අතිජාත පුත් රුවනක් වන්න
තදි ත් සිතට ගෙන වීරිය කර පන්න
එයි ත් මව් පියොත් නැයොත් සළකන්න
පට ත් ගනිති නුඹ මුදුනෙන් පිළිගන්න

ළමයි නි ළමයිනි හැර දඟැලිල්ලා
බැතියෙ නි රුතියෙනි බණ අහපල්ලා
සිහියෙ නි ණුවණිනි සිතට ගනිල්ලා
විරියෙ නි දිරියෙනි පිළිපැදපල්ලා

මවු පියන් අවසර
නැති ව ගෙදරින් පිටතට
කොපමණ ඕනැ වුවත්
කමඳවත් නො යන්නේ

තමන් ගුරු දෙගුරුනට කීකරු   වීම
නිතින් සෝවුරන් වෙත සෙනෙහස   පැම
ඔවුන් ගේ මෙකී සියලු මැ ගුණ   දැම
ලෙවන් සිතු සනස්වා ලයි එක   සේම

නුගත් අලස නිදිබර උඩඟු   නො කීකරු
රූපත් වුවද ඔල මොළ කුරිරු   ගති දූරු
පෝසත් නමුදු දුගියන් පෙළන   වද කරු
කාටත් නො රිසියෙත් ම ය දරුවො   මෙ අයුරු

මවු   පියනට අඩුගුණ පුත්   "අවජාත"
ඔවු   නට සමගුණ ඇතියේ   "අනුජාත"
ඔවු   නුදු ඉකුත් ගුණවත් පුත්   "අතිජාත"
කිවු   මුනිවරු වෙසෙසා මේ තුන්   ජාත

දන් දෙව් බණ අසව්
නිති බුදු ගුණ සිහි කරව්
හැම පින් කම් හි මැ යෙදෙව්
සන්සුන් වූ පැවැත්මෙන්

දහම   ට රිසිවන හොඳ   දරුවන්නේ
වැඩුම ට දෙවියන් පිහිට   ලැබෙන්නේ
සියර   ට දියුණුව ඉන්   සැලැසෙන්නේ
තමන   ට දෙලොවම සැපද   ලැබෙන්නේ

උ   දු සිරින් මුළු ලොව මෙලෙස   පිබිදෙත
නි   දා හිඳිනු ළමයිනි, අපට   සරි නැත
සෙ දා පිබිදූ මුව දෙවැ නිසි සෙ   හැඳැවත
වැ   දා බුදුන් දෙගුරුන් පොත උගත   යුත

තාත්තට වැඩි ගුණ
නැණ දනයෙන් දියුණු වී
අතිජාත පුත් රුවණක්
වන්නට වැර වඩන්නේ

දන් දෙව් බණ අසව්
නිති බුදු ගුණ සිහි කරව්

හැම පින්කම් හි මැ යෙදෙව්
සන්සුන් වූ පැවැත්මෙන්

නිකම් කා බී ඇඳ
පැළැඳ නැටුමෙන් ගැයුමෙන්
කල් ගෙවා ජරපත් වී
මැරී යාමෙන් කම් කිම?

දරුව න් බලන්නහු ළය සැනසෙයි කීම
පඬුව න් බසෙකි පෙර සිටැ පැවැතෙන බෝම
දූටුව න් සතුටු වන පියකරු හැසිරීම
ඇසූවන් පහදනා මොළොකැටි බස් දීම

හරු දූදන සමහම්
බජනේ සාදු සමහම්
රැ දෙවෙහි පින් කරනේ
අතිස බව නිති සිහි කරන්නේ

නිමි